ගෙවීම් කරන අලුත්ම ක්‍රමය GovPay

නව රජයේ දැක්ම අනුව ඩිජිටල් ආදායම් ආර්ථිකයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වැඩසටහන් රැසකි. ඒ අතරින් රථවාහන ස්ථානීය දඩ ගව්පේ (Govpay) ක්‍රමයට ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීමේ නියමු ව්‍යාපෘතිය ප්‍රවාහන අමාත්‍යාංශය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ඉක්ටා ආයතනය, ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය සහ ලංකා පේ ආයතනය එක්ව මේ වන විට ආරම්භ කර තිබේ. Govpay යනු පොලිස් ස්ථානීය දඩ ඩිජිටල් මාධ්‍ය හරහා ක්ෂණිකව ගෙවීමේ ක්‍රමයක් වන අතර, මේ ගෙවීමේ පහසුව MOBILE APPS 05ක් (BOC Smart Pay, Nations Direct, Peoples Pay, Frimi, Helakuru) සහ ONLINE BANKING සේවා 07ක් (DFCC Bank, Nations Direct, NDB Neos, NSB Bank, Pan Asia Bank, Sampath Bank, Seylan Bank) හරහා දැනට සිදු කිරීමට හැකියාව පවතී. ඉදිරියේදී මේ ගෙවීමේ පහසුව තවදුරටත් පුළුල් කිරීමට පියවර ගෙන තිබේ. ඒ අනුව පසුගිය 10 වැනිදා සිට හෙට (30) දක්වා අනුරාධපුර, කුරුණෑගල සහ මාතලේ දිස්ත්‍රික්කවල තෝරා ගත් පොලිස් කොට්ඨාස 12ක මේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මේ සඳහා ඉතා සාර්ථක ප්‍රතිචාර ලැබෙමින් පවතින අතර, නුදුරේදීම ගව්පේ ව්‍යාපෘතිය රට පුරා ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් වෙමින් පවතී. ඒ පිළිබඳව ගවේෂණාත්මකව කළ තොරතුරු විමසීමකි.

රටේ ආර්ථිකයට දායකත්වයක්

බිමල් රත්නායක
ප්‍රවාහන, මහා මාර්ග, සිවිල් ගුවන් සේවා ඇමැති

ප්‍රවාහන කටයුතුවලදී ජනතාව අතින් සිදු වන වැරදි සඳහා දඩ මුදල් ගෙවන්න සිදු වෙනවා. එලෙස සිදු වන ගෙවීම් පහසු කරවීමට ඩිජිටල් මාධ්‍ය හරහා ගව්පේ (GOVPAY) නමින් ක්‍රමවේදයක් හඳුන්වාදී තිබෙනවා. උදාහරණයක් ලෙස පෙට්ටගමක සල්ලි තියාගෙන හිටියාට ඒවා ප්‍රාග්ධනය වෙන්නේ නෑ. එක එක තැන්වල අපි තියාගෙන ඉන්න සල්ලි මේ පරිපථයට ඇතුළු කිරීම තමා මේ වෙන්නේ. එනිසා මේ ගෙවීමේ ක්‍රමයෙන් ජනතාවට පහසුවක් ඇතිවෙනවා වගේම රටට වෙන විදියකට ප්‍රාග්ධනයක් එකතු වෙනවා. එනිසා මම හිතනවා, මේ ගව්පේ ක්‍රමය රටේ ආර්ථිකයටත් යම් ආකාරයකින් දායක වෙනවා කියලා.

ගව්පේ ක්‍රමය පිළිබඳව පත්‍රිකාවකුත් මුද්‍රණය කර තිබෙනවා. එයිනුත් ජනතාවට මේ ගැන යම්කිසි අවබෝධයක් ලබා ගන්න පුළුවන්. අපි එකතු වෙලා මේ කරන්නේ නියමු ව්‍යාපෘතියක්. මෙහිදී අඩුපාඩුකම් වෙන්න පුළුවන්. එම අඩුපාඩු හඳුනාගෙන මේ ව්‍යාපෘතිය රට පුරාම ක්‍රියාත්මක කරන්න අපේක්ෂා කරනවා.

මුදල් නෝට්ටු පරිහරණයෙන් ඔබ්බට

එරංග වීරරත්න
ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය ඇමැති

අපේ රට ඩිජිටල්කරණය හරහා දැවැන්ත ගමනක් යෑමට ප්‍රමුඛත්වයදී තිබෙනවා. එහි එක් ප්‍රධාන අංගයක් ලෙස රාජ්‍ය සේවා ඩිජිටල්කරණය හඳුන්වා දෙන්න පුළුවන්. අපේ රටේ රාජ්‍ය සේවය හරියට ඩිජිටල්කරණය කළොත් අපට පුළුවන් මේ රට විශාල පරිවර්තනයක් කරා අරන් යන්න. එතුළින් මහජනතාවට මීට වඩා කඩිනම්, කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුතු රාජ්‍ය සේවාවන් ලබා දීමට හැකියාව ලැබෙනවා. යම්කිසි පුද්ගලයෙක් ඉන්න ඕනෑම ස්ථානයක සිට තමන්ට අවශ්‍ය රාජ්‍ය සේවාවන් ලබා ගත හැකි ආකාරයට මේ රට දියුණු කරන්න පුළුවන්. ඒ හරහා අපි බලාපොරොත්තු වන නිෂ්පාදන ආර්ථිකයෙන් රට දියුණු කරන දැවැන්ත වැඩපිළිවෙළට අවතීර්ණ වීමට හැකියාව ද ලැබෙනවා. මේ සියල්ල අවසානයේ සතුටින් සිටින ජනතාවක් බිහි කරන්නත් අපට හැකියාව ලැබෙනවා.

රාජ්‍ය සේවා ඩිජිටල්කරණයේ එක් ප්‍රධාන අංගයක් තමයි රාජ්‍ය සේවාවන්වලට කරන ගෙවීම් ඩිජිටල් මාධ්‍ය හරහා ඕනෑම ස්ථානයක සිට ඕනෑම වෙලාවක ගෙවන්නේ කොහොමද කියන එක. මේ සඳහා ගව්පේ (GOVPAY) කියන සේවාව භාවිත කර දැන් ඔබට පුළුවන් පොලිස් ස්ථානීය දඩ මුදල් ගෙවීම ඕනෑම ස්ථානයක සිට සිදු කරන්න. අපි දන්නවා, දුර බැහැර පළාතකට ගිහින් දඩ මුදලක් ගෙවන්න වුණාම වන රස්තියාදුව. තැපැල් කාර්යාලවලට ගිහින්, එසේත් නැත්නම් නිවාඩු දිනයක් නම් වෙනත් දවසක ගිහින් තමා ඒ කාර්යය සිදු කර ගන්න වෙන්නේ. එතුළින් ජනතාවගේ කාලය නාස්ති වෙනවා වගේම ඔවුන් අපහසුතාවට ද පත් වෙනවා. මේ තත්ත්වය නැති කරන්න අපි කළ එක වැඩපිළිවෙළක් තමයි, මේ දඩ මුදල් ගව්පේ (GOVPAY) ක්‍රමයට ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීමට අවස්ථාව සැලසීම.

මෙයින් අපි බලාපොරොත්තු වෙන්නේ ජනතාව මුදල් නෝට්ටු පරිහරණය කරන එකෙන් ඔබ්බට ගිහින් ඩිජිටල් මාධ්‍ය හරහා කොහොමද මුදල් ගෙවීම සිදු කරන්නේ කියන පරිවර්තනයට අරන් යන්න. එතුළින් මුදල් නෝට්ටු හරහා වන අකාර්යක්ෂමතා අවම කරගැනීමේ හැකියාව ද ලැබෙනවා. ජනතාවට හොඳ සේවාවක් ද ලැබෙනවා. ඒ වගේම ජනතාවට දඩ ගෙවන්න සිදු වන කාරණා ගැනත් සොයා බලා ඒවා වළක්වා ගැනීමට ද, මාර්ග නීති නිසි ලෙස පිළිපදින ජනතාවක් බිහිකිරීමට ද අවශ්‍ය කටයුතු කළ යුතුයි.

භාෂා තුනෙන්ම ගෙවීමේ පහසුකම

හර්ෂ පුරසිංහ
ඉක්ටා ආයතනයේ අධ්‍යක්ෂ

පසුගිය නොවැම්බර් මාසයේ අපි ICT ආයතනයට පත් වෙලා අංශ පහක් හරහා මේ ඩිජිටල්කරණයට අවතීර්ණ වුණා. ඒ අංශ පහෙන් ඉතාම වැදගත් අංශයක් තමයි, ඩිජිටල් ආදායම් ආර්ථිකය. නව රජයේ දැක්ම තමයි, 2030 වගේ වෙනකොට ඩොලර් බිලියන 15 ඉක්මවා යන අගයක් දළ දේශීය නිෂ්පාදනයට එකතු කිරීම. මේ ක්‍රියාවලියට අපි අවතීර්ණ වුණාම දුටු දෙයක් තමයි, රජයට ගෙවන ගෙවීම් කොහොමද ඉක්මනින් ඩිජිටල්කරණය කරන්නේ කියන එක. ඒ යටතේ තමයි අපි මේ ගව්පේ (GOVPAY) කියන ව්‍යාපෘතිය පටන් ගත්තේ.

පසුගිය පෙබරවාරි මාසයේ 07 වැනිදා අපි ගව්පේ (GOVPAY) එළිදැක්වීම සිදු කළා. ඒ ආයතන 18ක් එක්ක. කියන්න සතුටුයි, අද වෙනකොට ආයතන 28ක් මේ සඳහා සම්බන්ධ වී සිටිනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා, විශ්වවිද්‍යාල, අපේක්ෂා රෝහල ආදී නොයෙකුත් ආයතන ගණනාවක් මේ සඳහා සම්බන්ධවී සිටිනවා. දැන් මේ ආයතනවලට ඩිජිටල් මාධ්‍ය ඔස්සේ ගෙවීම් කරන්න පුළුවන්.

මෙහිදී ජනතාවගෙන් අපට ආ අදහසක් තමයි, කවදද දඩ මුදල් ගව්පේ (GOVPAY) හරහා ගෙවන්න සලස්වන්නේ කියලා. පසුව අපි ශ්‍රී ලංකා පොලීසියත් එක්ක පෙබරවාරි මාසයේ මේ ගැන සාකච්ඡා පටන් ගත්තා. පසුගියදා දඹුල්ල නගරයේදී කුරුණෑගල සිට අනුරාධපුර දක්වා ඇති පොලිස් ස්ථාන 11ක් සම්බන්ධ කරගෙන ඉතා සාර්ථක වැඩමුළුවක් පැවැත්වූවා. මේ සඳහා පොලීසියෙන් ලැබුණු ප්‍රතිචාර ධනාත්මකයි. කුරුණෑගල සිට දඹුල්ලට A 6 සහ දඹුල්ලේ සිට අනුරාධපුරට A 9 මාර්ග ඔස්සේ අපේ නියමු ව්‍යාපෘතිය පටන් ගත්තා. එහිදී ලංකා බැංකුව හරහා මැල්සිරිපුරදී පළමු රථවාහන දඩ මුදල ගෙවා රියදුරු බලපත්‍රය නිදහස් කරගැනීම ද සිදු වුණා. තිබුණු දඩ පත්‍රිකාවම තමයි. රියැදුරෙක් යම් වරදක් කර ඒ වෙනුවෙන් පොලීසිය විසින් දඩ පත්‍රිකාව යොමු කළාම ඔහුට වෙනදා වගේ තැපැල් කන්තෝරුවලට යන්න ඕනෙ නෑ. ඒ වෙලාවේ පොලිස් නිලධාරියා අහයි මේ දඩ මුදල ගෙවන්නේ කොහොමද කියලා. අපි ගව්පේ ක්‍රමයට මේ දඩ මුදල් ගෙවන්නේ කොහොමද කියලා අත් පත්‍රිකාවක් මේ දඩ කොළය සමඟ ලබා දීමටත් කටයුතු කර තියෙනවා. එහි පියවරෙන් පියවර මේ ගෙවීමේ ක්‍රමය සිදු කරන ආකාරය පැහැදිලි කර තියෙනවා. එය හොඳින් කියවා තමන් ඉන්න ඕනෑම තැනක සිට මේ දඩ මුදල ගෙවීමේ හැකියාව ලැබෙනවා. තමන්ගේ බැංකු පහසුකම හෝ මොබයිල් ඇප් හරහා (මොබයිල් ඇප් සියල්ලම තාම මීට සම්බන්ධවී නෑ) මේ ගෙවීම කරන්න පුළුවන්. භාෂා තුනෙන්ම මේ පහසුකම සලසා තිබෙනවා.

ඕනෑම වෙලාවක, ඕනෑම තැනක ඉඳන් රථවාහන දඩ ඇතුළුව රාජ්‍ය ආයතන රැසකට ඔන්ලයින් ගෙවීම් කරන්න

GovPay

GovPay හරහා ගෙවීම් කිරීම පහසුයි.

පියවර 1
- GovPay හා සම්බන්ධ ඔබේ බැංකුවේ ඉන්ටර්නෙට් බැංකින්/මොබයිල් බැංකින් පෝටලයට හෝ GovPay සේවාව හා සම්බන්ධ ගෙවීම් app එකකට පිවිසෙන්න.

පියවර 2
- ගෙවීම්/බිල් ගෙවීම් යටතේ දැක්වෙන 'රාජ්‍ය ගෙවීම්' මෙනුව තෝරා, එහි දැක්වෙන 'GovPay' මෙනුව තෝරන්න.

පියවර 3
- මෙනුවේ සඳහන් රාජ්‍ය ආයතන අතරින්, 'ශ්‍රී ලංකා පොලීසිය' තෝරා, එහි දැක්වෙන ගෙවීම් කාණ්ඩ අතරින් 'රථ වාහන දඩ' තෝරන්න.

පියවර 4
- වාහනයේ ලියාපදිංචි අංකය සහ රියදුරු බලපත්‍ර අංකය ඇතුලත් කරන්න.
- දඩ පත්‍රිකාවේ සඳහන් වන පොලිස් ස්ථානය තෝරන්න.
- GovPay සඳහා අදාළ රථවාහන පොලිස් නිලධාරියාට ලබා දී ඇති දුරකථන අංකය තෝරන්න.
- දඩ පත්‍රිකාවේ සඳහන් දඩ කාණ්ඩය හෝ දඩ කාණ්ඩ තෝරා අදාළ ගෙවීම සිදු කරන්න.

පියවර 5
- අදාළ ගෙවීම සාර්ථකව සිදු කිරීමෙන් අනතුරුව, ඒ පිළිබඳ තහවුරු කිරීමේ SMS පණිවිඩයක් අදාළ රථවාහන පොලිස් නිලධාරියා වෙත ලැබෙනු ඇත.
- සිදුකරන ලද වරදට අදාළ දඩය එවෙලේම සිදුකල හැකි නම්, දඩය ගෙවීමෙන් අනතුරුව,අදාළ රථවාහන පොලිස් නිලධාරියා රඳවා ගත් ඔබේ රියදුරු බලපත්‍රය එවෙලේම ඔබට නැවත ලබාදෙනු ඇත.
- සියළුම ගෙවීම් ශ්‍රී ලංකා පොලීසියේ බැංකු ගිණුමට ක්ෂණිකව බැර වන අතර, ගෙවීම තහවුරු කිරීමේ ඊ-රසිට් පතක් ගනුදෙනුව අවසානයේ ඔබට බාගතකල හැක.

නඩුවක් නොදමා මුදල ගෙවීමේ හැකියාව

ඉන්දික හපුගොඩ
මාර්ග ආරක්ෂාව සහ රථවාහන දිසා භාර නියෝජ්‍ය පොලිස්පති

ශ්‍රී ලංකා පොලීසිය, ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය, ලංකා පේ ආයතනය, ඉක්ටා ආයතනය සහ ICT ආයතනය සම්බන්ධ වෙලා ප්‍රවාහන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි මේ ගව්පේ රථවාහන දඩ මුදල් ක්ෂණිකව ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කර තිබෙනවා. ශ්‍රී ලංකා පොලීසියේ කුරුණෑගල, මාතලේ සහ අනුරාධපුර කොට්ඨාස මූලික කරගෙන ඒ 6 සහ ඒ 9 මාර්ගයේ තිබෙන කුරුණෑගල, දොරටියාව, මැල්සිරිපුර, ගොකරැල්ල, ගලේවෙල , දඹුල්ල, මඩාටුගම, මරදන්කඩවල, කැකිරාව , තිරප්පනේ, කවරක්කුලම, අනුරාධපුර යන පොලිස් ස්ථාන 12ක සහ කොට්ඨාස රථවාහන ස්ථානාධිපතිවරුන් සම්බන්ධ කරගෙන පසුගිය 09 වැනි දින මේ වැඩපිළිවෙළ ආරම්භ කළා. එහි නියමු ව්‍යාපෘතිය පසුගිය 10 වැනිදා සිට හෙට (30) දක්වා ක්‍රියාත්මකයි. නඩුවක් වෙනුවට දඩ පත්‍රිකාවක් ලබා ගැනීමේ ගැසට් පත්‍රයේ සහ මෝටර් වාහන පනතේ වැරදි ඇතුළත් කර මේ ඔන්ලයින් ගෙවීම ගව්පේ (GOVPAY)හරහා සිදු කිරීමට හැකියාව ලැබෙනවා. රථවාහන දඩ මුදලක් වෙනුවට නඩුවක් නොදමා ක්ෂණිකව එම මුදල ගෙවා රියදුරු බලපත්‍රය ලබාගැනීමේ හැකියාව මෙයින් ලැබෙනවා. මෙය පසුගිය 10 වැනි දින සිට ඉතාමත් සාර්ථකව කරගෙන යනවා. මෙයින් මහජනතාවගේ කාලය ඉතුරු වෙනවා. අපහසුතාවට පත්වීම වැළැක්වෙනවා.

ඉදිරියේදී රජයේ සියලු ආයතන සඳහා පහසුකම්

චන්න ඩී. සිල්වා
ලංකා පේ ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී

ඩිජිටල් ආර්ථිකය හරහා කාසි සහ නෝට්ටුවලින් ඔබ්බට ගිහින් ඩිජිටල් ක්‍රමවේදය යටතේ ගෙවීම් පහසුකම් ලබා දෙන්න ප්‍රධාන හේතු කිහිපයක් තියෙනවා. එකක් තමයි සිදු වන අක්‍රමිකතා වළක්වා ගැනීම. ඩිජිටල් මාධ්‍ය හරහා ගෙවීම් සිදු කිරීමෙන් අක්‍රමිකතා සිදු වුවත් එය සොයා ගැනීමේ හැකියාව පවතිනවා. ඊට අමතරව අපේ ආයතනය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ණ නියාමනය යටතේ තමා මේ කටයුතු සිදු වන්නේ. මුදල් ගනුදෙනු තහවුරු කිරීම සහ සුරක්ෂිතතාව මහ බැංකුවෙන් සහ අනෙකුත් බැංකුවලින් ලබා දෙනවා. බැංකු අතර මේ ගනුදෙනුව සිදුවීම නිසා මුදල්වල සුරක්ෂිතවය තහවුරු වෙනවා.

ඇයි අපි කියන්නේ කාසි සහ නෝට්ටුවලින් ඔබ්බට යන්න කියලා. ජනතාවගෙන් බහුතර පිරිසක් ඩිජිටල්කරණයට ගිහින් තිබුණාට තවත් පිරිසක් අතර කාසි සහ නෝට්ටු භාවිත වෙනවා. මහ බැංකුවේ දත්තවලට අනුව වසරකට ට්‍රිලියන 1.3ක් මෙලෙස ජනතාව අතර භාවිත වෙනවා. (2024 දත්තවලට අනුව) මෙයින් ට්‍රිලියනයක් තියෙන්නේ මහජනතාව අතේ. මෙහි ආරක්ෂිතභාවය පැත්තක තිබ්බත් රටක ආර්ථිකයටත් ලොකු වියදමක් මේ කාසි සහ නෝට්ටු. මොකක්ද මේ වියදම? මහ බැංකුවෙන් කාසි සහ නෝට්ටු මුද්‍රණය කරන්න ඕනේ. මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදු වෙනවා. ඊට අමතරව මේ මුදල් විසුරුවා හරින්න ඕනෙ. ඒකට ආරක්ෂක අංශ ශක්තිමත් කරන්න ඕනෙ. මේ සියලු වියදම් සඳහා දළ ජාතික නිෂ්පාදනයෙන් 1.5ක් පමණ වැය වෙනවා. ජනතාව අතර මේ මුදල් ගැවසීමෙන් කිසිවකුටත් වාසියක් නෑ. එනිසා මේ ට්‍රිලියනය අපේ ආර්ථිකයට විශාල පාඩුවක්. අපේ රටේ අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන්නේ දළ ජාතික නිෂ්පාදනයෙන් 2%ක් වගේ ප්‍රමාණයක්. මේ කාසි සහ නෝට්ටු පරිහරණයට දළ ජාතික නිෂ්පාදනයෙන් 1.5%ක් පමණ වැය කරනවා. එයින් 30%ක් 40%ක් ඩිජිටල් තාක්ෂණය හරහා ඉතුරු කර ගත්තොත් එය අස්වැසුම වගේ ව්‍යාපෘතිවලට ලබා දී ප්‍රයෝජනයක් ගන්න අපට පුළුවන්. රටක ආර්ථිකයට එයින් විශාල දායකත්වයක් ලැබෙනවා.

සති දෙකට වාහන දඩ 103කට ක්ෂණික ගෙවීම්

උදය එච්. කස්තුරිරත්න
ඩිජිටල් රාජ්‍ය සහ ඩිජිටල් ආදායම් ආර්ථික ප්‍රධානී

ගව්පේ (GOVPAY) හරහා පොලිස් ස්ථානීය දඩ ගෙවීමේ නියමු ව්‍යාපෘතිය පටන් ගත්තේ පසුගිය 10 වැනිදා. අනුරාධපුර, කුරුණෑගල සහ මාතලේ දිස්ත්‍රික්කවල තෝරාගත් පොලිස් බලප්‍රදේශ 12ක් සහ ඒ ආශ්‍රිත හයිවේ මාර්ග තුනකුත් ඇතුළුව 15ක් ශ්‍රී ලංකා පොලීසියත් සමඟ එක්ව මේ සඳහා තෝරා ගත්තා. මේ සති දෙක ඇතුළත කාලයේ රථවාහන දඩ 103ක් සඳහා ගව්පේ හරහා කළ ගෙවීම්වලින් ලැබූ ආදායම එක්ලක්ෂ තිස්දහස ඉක්මවා තිබෙනවා. මේ ගෙවීම සිදු කරන්න දැනට අපේ තියෙන යෙදවුම් ලෙස බැංකු ජංගම යෙදවුම් සහ fINTECH ජංගම යෙදවුම් හඳුන්වා දෙන්න පුළුවන්. දැනට FINTECH යෙදවුම් දෙකක් සහ බැංකු යෙදවුම් 11ක් ගව්පේ හරහා පොලිස් දඩ ගෙවීමට සම්බන්ධ වෙලා තියෙනවා. දැනටමත් අපි අත් පත්‍රිකාවක් ලබා දෙනවා පොලිස් ප්‍රදේශවල සියලුම රථවාහන පොලිස් නිලධාරීන්ට. එම නිලධාරීන් යම් රියැදුරෙක් රථවාහන වරදකට හසු වුණාම මේ අත් පත්‍රිකාව ඔහුට ලබා දෙනවා. දැනට ලබා දී තිබෙන අත් පත්‍රිකාවේ QR කේතයක් සඳහන් කර තියෙනවා. රියැදුරාට පුළුවන් ඒ කේතය ස්කෑන් කිරීමෙන් කුමන බැංකුව ඔස්සේ ද මේ සේවාවන් කරන්න පුළුවන් කියලා දැන ගන්න. පොලිස් නිලධාරීන් මෙන්ම ප්‍රවාහන අමාත්‍යාංශයේ දැඩි උනන්දුවක් මේ සේවාව සඳහා තියෙනවා. එනිසා නුදුරේදීම මේ සේවාව දිවයින පුරා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් පොලීසියේ අවශ්‍යතාව අනුව ආරම්භ කෙරෙනවා. ජූනි මාසයේ සිට මෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට දැන් සැලසුම් සකස් කරමින් යනවා.

මට දඩ මුදල ගෙවීම පහසු වුණා

ගව්පේ (GOVPAY) හරහා මුලින්ම රථවාහන දඩ ගෙවීම සිදු කළ මඩකලපුවේ පදිංචි **ප්‍රියන්කන්**

ගව්පේ හරහා රථවාහන දඩ ගෙවීමට තියෙන එක හොඳයි. මම මඩකලපුවට යන ගමන් කුරුණෑගල පහුකරලා මැල්සිරිපුරදී තමා මේ දඩ ගෙවීම සිදු කළේ. මෙහෙම ක්‍රමයක් තිබුණ නිසා මට දඩ මුදල ගෙවීම පහසු වුණා. මගෙ කාලය ඉතුරු වුණා. මෙහෙම ක්‍රමයක් නොතිබුණා නම් මම මඩකලපු ගිහින් නැවත මැල්සිරිපුරට ඇවිත් තැපැල් කාර්යාලයට ගිහින් තමා මේ දඩ මුදල ගෙවන්න වෙන්නේ. අනෙක ඇප් එකත් හොඳයි. ලංකා බැංකුව හරහා තමයි ගෙවීම කළේ.

දිල්හානි ජයවර්ධන

2025 අප්‍රේල් 29 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.